# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.18 පැය 0815 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out / 767 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීමක් සම්බන්ධ තොරතුරු</u>**

**01. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා මිනුවන්ගොඩ කඳවුර.**

2025.04.17 වන දින උදෑසන කාලයේදී ජාඇල පොලිස් වසමේ ශාන්ත මැතිව් මාවත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා මිනුවන්ගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 15ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වන පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. කෙරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා මන්නාරම කඳවුර.**

2025.04.17 වන දින අළුයම් කාලයේදී මන්නාරම පොලිස් වසමේ මන්නාරම පල්ලිමුනේ මාගර්යේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර කේරළ ගංජා ග්‍රෑම් 200ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34ක් වන උප්පුකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා මාන්කුලම් කඳවුර.**

2025.04.17 වන දින දහවල් කාලයේදී මාන්කුලම් පොලිස් වසමේ පුලියන්කුලම් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 21ක්, ගෝඩා ලීටර් 90ක් සහ තඹ දඟරයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාන්කුලම් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 35ක් වන ඕලුමඩු, මාන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාන්කුලම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල ජායාරූපයක් මේ සමඟ යොමු කරමි.

## 04. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.

2024.04.17 වන දින උදෑසන කාලයේ තලාතුඔය පොලිස් වසමේ මුදුනකඩේ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 400ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන තලාතුඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 70 ක් වන තලාතුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**